# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2455/29 - 2025 සැප්තැම්බර් මස 25 වැනි බ්‍රහස්පතින්දා - 2025.09.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**එල්.ඩී.බී. 24/1951 (xiv)**

**(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත**

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වන වගන්තිය සමග කියවිය යුතු 141 වන, 143 වන, 144 වන, 157අ වන, 168 වන සහ 190 වන වගන්ති යටතේ ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**බිමල් නිරෝෂන් රත්නායක,**
ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ,
සිවිල් ගුවන් සේවා අමාත්‍ය.

2025 සැප්තැම්බර් මස 25 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2018 ජනවාරි මස 15 වැනි දින අංක 2054/8 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝග මගින් සංශෝධිත 2011 අගෝස්තු මස 03 වැනි දින අංක 1717/14 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2011 අංක 2 දරන මෝටර් වාහන (අධිවේගී මහා මාර්ග) නියෝග, එහි 8 වැනි නියෝගයට ඉක්බිතිව ම පහත දැක්වෙන නියෝග ඇතුළත් කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

"8අ. අධිවේගී මහා මාර්ගයක ධාවනය කරනු ලබන හෝ භාවිත කරනු ලබන මෝටර් වාහනයක රියදුරකු සහ එම මෝටර් වාහනයේ යම් ආසනයක අසුන්ගෙන සිටිනු ලබන සහ ගමන් කරනු ලබන සෑම මගියකු ම සහ පුද්ගලයකු ම, එම මෝටර් වාහනය අධිවේගී මහා මාර්ගයේ ධාවනය කරනු ලබන හෝ භාවිත කරනු ලබන අතරතුර දී. 8ඉ වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති වර්ගයේ පුද්ගල ආරක්ෂක ආසන පටියක් පැළඳ සිටිනු ලැබිය යුතු ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

8ආ. යම් මෝටර් වාහනයක්, එහි රියදුරු, එහි ආසනයක අසුන්ගෙන සිටිනු ලබන සහ ගමන් කරනු ලබන සෑම මගියකු ම සහ පුද්ගලයකු ම විසින් පැළඳ සිටිනු ලැබිය යුතු නිසි පරිදි ක්‍රියාකරන 8ඉ වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පරිදි පුද්ගල ආරක්ෂක ආසන පටි සවිකර ඇති මෝටර් වාහනයක් වන්නේ නම් මිස, එම මෝටර් වාහනයේ රියදුරු විසින් එම මෝටර් වාහනය අධිවේගී මහා මාර්ගයකට ඇතුළත් කරනු ලැබීම හෝ අධිවේගී මහා මාර්ගයක ධාවනය කිරීම හෝ භාවිත කිරීම කරනු නොලැබිය යුතු ය.

8ඇ. යම් මෝටර් වාහනයක්, එහි රියදුරු, එහි ආසනයක අසුන්ගෙන සිටිනු ලබන සහ ගමන් කරනු ලබන සෑම මගියකු ම සහ පුද්ගලයකු ම විසින් පැළඳ සිටිනු ලැබිය යුතු නිසි පරිදි ක්‍රියාකරන 8ඉ වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පරිදි පුද්ගල ආරක්ෂක ආසන පටි සවිකර ඇති මෝටර් වාහනයක් වන්නේ නම් මිස, එම මෝටර් වාහනයේ අයිතිකරු විසින් එම මෝටර් වාහනය අධිවේගී මහා මාර්ගයකට ඇතුළත් කරනු ලැබීම හෝ ඇතුළත් කරනු ලැබීමට සැලැස්වීම සිදු කරනු නොලැබිය යුතු ය.

8ඈ. (1) 8අ, 8ආ සහ 8ඇ වන නියෝග ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට මාස තුනක් සම්පූර්ණ වීමෙන් පසුව පහත දැක්වෙන මෝටර් වාහන පන්ති සම්බන්ධයෙන් 8අ, 8ආ සහ 8ඇ වන නියෝගවල විධිවිධාන අදාළ වීම ආරම්භ වන්නේ ය:-

(අ) 8අ, 8ආ සහ 8ඇ වන නියෝග ක්‍රියාත්මක වීම ආරම්භ වන විට නිෂ්පාදකයා විසින් පසුපස මැද ආසනය සඳහා 8ඉ වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පරිදි පුද්ගල ආරක්ෂක ආසන පටියක් සවිකර නොමැති මෝටර් රථයක් අධිවේගී මහා මාර්ගයක ධාවනය කරනු ලබන හෝ භාවිත කරනු ලබන හෝ අධිවේගී මහා මාර්ගයකට ඇතුළත් කරනු ලබන එම මෝටර් රථයේ රියැදුරු හෝ අයිතිකරු;

(ආ) 8අ, 8ආ සහ 8ඇ වන නියෝග ක්‍රියාත්මක වීම ආරම්භ වන විට නිෂ්පාදකයා විසින් පසුපස මැද ආසනය සඳහා හෝ පසුපස විවිධ ආසන සඳහා 8ඉ වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පරිදි පුද්ගල ආරක්ෂක ආසන පටි සවිකර නොමැති සැහැල්ලු මෝටර් කෝච් රථයක්, මෝටර් කෝචයක්, බර මෝටර් කෝච් රථයක්, ද්විත්ව කාර්ය වාහනයක්, සැහැල්ලු මෝටර් ලොරියක්, බර මෝටර් ලොරියක් හෝ මෝටර් නිවසක් අධිවේගී මහා මාර්ගයක ධාවනය කරනු ලබන හෝ භාවිත කරනු ලබන හෝ අධිවේගී මහා මාර්ගයකට ඇතුළත් කරනු ලබන එම සැහැල්ලු මෝටර් කෝච් රථයේ, මෝටර් කෝචයේ, බර මෝටර් කෝච් රථයේ, ද්විත්ව කාර්ය වාහනයේ, සැහැල්ලු මෝටර් ලොරියේ, බර මෝටර් ලොරියේ හෝ මෝටර් නිවසේ, රියදුරු හෝ අයිතිකරු;

(ඇ) 8අ, 8ආ සහ 8ඇ වන නියෝග ක්‍රියාත්මක වීම ආරම්භ වන විට නිෂ්පාදකයා විසින් පසුපස මැද ආසන සඳහා හෝ පසුපස විවිධ ආසන සඳහා 8ඉ වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පරිදි පුද්ගල ආරක්ෂක ආසන පටි සවිකර නොමැති දෛනික කාර්යාල ප්‍රවාහන සේවයේ හෝ පාසල් ප්‍රවාහන සේවයේ නියුතු ද්විත්ව කාර්ය වාහනයක්, සැහැල්ලු මෝටර් කෝච් රථයක්, මෝටර් කෝචයක් හෝ බර මෝටර් කෝච් රථයක්, අධිවේගී මහා මාර්ගයක ධාවනය කරන හෝ භාවිත කරන හෝ අධිවේගී මහා මාර්ගයකට ඇතුළත් කරන එකී ද්විත්ව කාර්ය වාහනයේ, සැහැල්ලු මෝටර් කෝච් රථයේ, මෝටර් කෝචයේ හෝ බර මෝටර් කෝචයේ රියදුරු හෝ අයිතිකරු.

(2) 8අ, 8ආ සහ 8ඇ වන නියෝගවල විධිවිධාන -

(අ) වයස අවුරුදු 12ට අඩු දරුවන් සහ උස සෙන්ටිමීටර් 135 නොඉක්මවන තැනැත්තන් සඳහා;

(ආ) වෛද්‍ය හේතූන් මත යම් තැනැත්තකු සඳහා ආසන පටියක් පැළඳීම යෝග්‍ය නොවන බවට සඳහන් කරමින් ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයකු විසින්, 2011 අගෝස්තු මස 09 වැනි දින අංක 1,718/12 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2011 අංක 3 දරන මෝටර් වාහන (ආසන පටි) නියෝගයේ II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට සාරානුකූලව නිකුත් කරන ලද සහ අත්සන් කරන ලද වලංගු වෛද්‍ය සහතිකයක් දරනු ලබන එම තැනැත්තා සඳහා; සහ

(ඇ) හදිසි අවස්ථා වාහනයක ගමන් කරනු ලබන මගීන් සඳහා,

අදාළ නොවිය යුතු ය.

8ඉ. 8අ, 8ආ සහ 8ඇ වන නියෝග අදාළ වනු ලබන සෑම මෝටර් වාහනයක් සඳහා ම සවිකළ යුතු බවට නියමිත පුද්ගල ආරක්ෂක ආසන පටි වර්ගය පහත දැක්වෙන පරිදි විය යුතු ය:-

(අ) රියදුරුගේ ආසන පටිය, බඳ හරහා ඉහළට දිවෙන පටියක් සහ බඳ හරහා පාර්ශ්විකව දිවෙන පටියකින් සමන්විත, සවිකරන ස්ථාන තුනක් සහිත ප්‍රමිතිගත ආසන පටියක් විය යුතු ය; සහ

(ආ) ඉදිරි පෙළ ආසන ඇතුළුව අනෙකුත් ආසන සඳහා ආසන පටි, ආසනවල සැලැස්ම මත පදනම්ව, අවම වශයෙන් සවි කිරීම් ස්ථාන දෙකක්වත් සහිත බඳ හරහා පාර්ශ්විකව දිවෙන පටියකින් සමන්විත ප්‍රමිතිගත ආසන පටියක් විය යුතු ය.

8ඊ. 8ඈ වන නියෝගයේ (2) වන උපනියෝගයේ විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, 2011 අගෝස්තු මස 09 වැනි දින අංක 1,718/12 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබ ඇති 2011 අංක 3 දරන මෝටර් වාහන (ආසන පටි) නියෝගවල විධිවිධාන, අධිවේගී මහා මාර්ගයක ධාවනය කරනු ලබන හෝ භාවිත කරනු ලබන හෝ අධිවේගී මහා මාර්ගයකට ඇතුළත් කරනු ලබන මෝටර් වාහනවල රියදුරු හෝ අයිතිකරු සඳහා අදාළ නොවිය යුතු ය.”.

EOG 09 - 0239

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.